# ලකුණු බෙදී යාමේ ආකාරය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| I පත්‍රය | - | 02 x 50 | = | 100 | | |
| II පත්‍රය | - | I කොටස | = | 02 x 20 | = | 40 |
| | | II කොටස | = | 01 x 20 | = | 20 |
| | | III කොටස | = | 02 x 20 | = | $\frac{40}{100}$ |

I පත්‍රය = 100

II පත්‍රය = 100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ....................................................... √ △ $\frac{4}{5}$

(ii) ....................................................... √ △ $\frac{3}{5}$

(iii) ....................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

අ:පොඃසඃ (උ.පෙ) විභාගය - 2019 අගෝස්තු (පැරණි නිර්දේශය)
ප්‍රශ්න පත්‍රයේ ලකුණු බෙදී යාමේ සාරාංශය
පෙරදිග සංගීතය - 1 පත්‍රය
එක් පිළිතුරකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50 ට මුළු ලකුණු 100 යි.

පෙරදිග සංගීතය - 11 පත්‍රය

**i කොටස**

( i.) ලකුණු 08
( ii.) ලකුණු 07
( iii.) ලකුණු 03
( iv.) ලකුණු 02

ලකුණු 20 කි.

2. .
( i.) ලකුණු 07
( ii.) ලකුණු 06
( iii.) ලකුණු 04
( iv.) ලකුණු 03

ලකුණු 20 කි.

3. .
( i.) ලකුණු 08
( ii.) ලකුණු 04
( iii.) ලකුණු 03
( iv.) ලකුණු 03
( v.) ලකුණු 02

ලකුණු 20 කි

**ii කොටස**

4.
( i.) ලකුණු 02
( ii.) ලකුණු 04
( iii.) ලකුණු 08
( iv.) ලකුණු 06

ලකුණු 20 කි.

5. .
( i.) ලකුණු 04
( ii.) ලකුණු 04
( iii.) ලකුණු 04
( iv.) ලකුණු 08

ලකුණු 20 කි.

## iii කොටස

6.

| | | |
|---|---|---|
| ( i.) | ලකුණු | 02 |
| ( ii.) | ලකුණු | 06 |
| ( iii.) | ලකුණු | 06 |
| ( iv.) | ලකුණු | 06 |

**ලකුණු 20 කි.**

7.

| | | |
|---|---|---|
| ( i.) | ලකුණු | 04 |
| ( ii.) | ලකුණු | 08 |
| ( iii.) | ලකුණු | 04 |
| ( iv.) | ලකුණු | 04 |

**ලකුණු 20 කි.**

8.

| | | |
|---|---|---|
| ( v.) | ලකුණු | 08 |
| ( vi.) | ලකුණු | 04 |
| ( vii.) | ලකුණු | 04 |
| ( viii.) | ලකුණු | 04 |

**ලකුණු 20 කි.**

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය . 2019 අගෝස්තු

## පෙරදිග සංගීතය 1

**අභිමතාර්ථ :-**

01. රිෂභය හා පංචමය වාදී, සංවාදී වන රාග යුගලය තෝරයි.
02. "පරමේල ප්‍රවේශක" රාගය තෝරා නම් කරයි.
03. ''අලංකාරික තාන'' ආකෘතියට අනුව අන්තර්ගතය තෝරයි.
04. සම ප්‍රකෘති රාග යුගලය තෝරයි.
05. රාග ආලාප ගායනය/ වාදනය සඳහා වඩාත් ම ප්‍රයෝජනවත් අංගය තෝරයි.
06. ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන රාගය තෝරයි.
07. ස්වර ප්‍රස්තාරයේ ඇතුළත් තානාලංකාර වර්ගය නම් කරයි.
08. ස්වර ප්‍රස්තාරයේ ඇතුළත් ඛන් හා මූර්කි ස්වර විධි තෝරයි.
09. තානාලංකාර කොටසින් දැක්වෙන ශිල්ප ක්‍රමය හඳුනා ගනී.
10. දී ඇති අවනද්ධ අක්ෂර සියල්ලම භාවිත වන තාල දෙක නම් කරයි.
11. විභාග 4 හිම එකිනෙකට වෙනස් වූ මාත්‍රා සංඛ්‍යා යෙදෙන තාලය හඳුනා ගනී.
12. ස්වර ප්‍රස්තාරයේ දැක්වෙන වාදිතය අයත් රාගය හා තාලය නම් කරයි.
13. '' **සංගීතය** '' නිර්වචනය කර ඇති සංගීත ග්‍රන්ථය තෝරයි.
14. තත් වාද්‍ය භාණ්ඩ තුනේ ලක්ෂණ අධ්‍යයනය කර එම භාණ්ඩ පිළිවෙලින් තෝරයි.
15. කර්ණාටක සංගීත පද්ධතියට අයත් කරුණු ඇතුළත් අක්ෂර වෙන් කර හඳුනා ගනී.
16. අක්ෂර යටතේ දී ඇති තොරතුරු වලට අදාළ ගායන ශෛලිය නම් කරයි.
17. තාල රූපයට අදාළ උඩරට බෙර පදය තෝරයි.
18. ගී පාද අතුරෙන් සාමූහික බව දනවන ගී පාද හඳුනා ගනී.
19. රාග පදනම්ව නිර්මාණය වී ඇති නූර්ති ගීතය නම් කරයි.
20. ජන ජීවිතයේ තොරතුරු ඒකාකාරී නාදමාලාව ඇතුළත් පැරණිම ගීත විශේෂය හඳුනා ගනී.
21. තනුවකට අනුව ගීතයේ මැද හෝ අග තාලානුකූලව බෙර පද ගායනා කරන ගීත විශේෂය තෝරයි.
22. කාන්තාවන් විසින් ගයනු ලබන මෙහෙ ගී විශේෂය හඳුනා ගනී.
23. ''පස්තිත ට'' අනුව ගැයෙන උඩරට නර්තන අංගය නම් කරයි.
24. නම් කර ඇති කෝලම් ගීතය ගයනු ලබන චරිතය නම් කරයි.
25. චරිත අනුව රංග ශෛලීන් අනු පිළිවෙලින් තෝරයි.
26. සමූහ වාදන සහ ගායන අංග දෙකම යොදා ගන්නා බටහිර සංගීතාංගය නම් කරයි.
27. සූත්‍රධාරී චරිතය ඇතුළත් රංග ශෛලිය නම් කරයි.

28. අංග හතරක් ඇතුළත් ගායන ශෛලිය නම් කරයි.

29. සින්ගල් රීඩ් (single reed ) වර්ගයට අයත් භාණ්ඩයක් නම් කර බැසූන් සහ ඕබෝ (Bassoon and Obo ) යන සුෂිර වාද්‍ය භාණ්ඩ නම් කරයි.

30. ෆ්ලැට් සහ ෂාප් (Flat and Sharp ) ස්වර කිසිවක් නොයෙදෙන මයිනර් ස්කේලය (Minor Scale) නම් කරයි.

31.

32.

33. උත්තර භාරතීය රාගධාරී සංගීතයේ රාග, තාල, සංගීත භාණ්ඩ, රාග විස්තර යන ප්‍රායෝගික කොටස් භාවිතය පිළිබඳව අවබෝධය පෙන්නුම් කරයි

34.

35. දෙන ලද තොරතුරු අනුව ගායන ශෛලිය හා ගීත විශේෂය නම් කරයි.

36. දෙන ලද සංගීතඥයින් දෙදෙනා වාදනය කරන, සංගීත භාණ්ඩ යුගලය නම් කරයි.

37. හෙළ ගී මග සහ ක්‍රමික් පුස්තක් මාළිකා යන ග්‍රන්ථ දෙක රචනා කළ කතුවරුන් නම්කරයි.

38. සත් සමුදුර චිත්‍රපටයේ සංගීත අධ්‍යක්‍ෂණය හා තේමා ගීතය ගැයූ සංගීතඥයින් නම් කරයි.

39. දෙන ලද ස්වර අභ්‍යාසයේ තුන්වන පියවර හා අවරෝහණයේ පළමු පියවර හඳුනා ගනී.

40. දෙන ලද ස්වර ඛණ්ඩයන්ට අදාළ වන රාග නම් කරයි.

41. කායදා හා තිහායි යන සංකල්පය හඳුනා ගනී.

42. කවිකාර මඩුවේ සේවය කළ සංගීතඥයෙක් සහ නිර්මාණය කළ නාඩගමක් නම් කරයි.

43. සිංහල ගීතයක් කණ්ඩායම් සංගීතය සඳහා ප්‍රථම වරට යොදා ගත් සංගීත කණ්ඩායමේ නම සහ එහි නිර්මාතෘවරයා නම් කරයි.

44. නාඩගමක චරිත දෙකක් අතර කෙරෙන සංවාදාත්මක ගී පද කොටස නම් කර ඒ සඳහා උදාහරණ තෝරයි.

45. බහුවිධ බුද්ධි න්‍යාය හඳුන්වා දුන් මනෝ විද්‍යාඥයා හා එම සිද්ධාන්තය අනුව ස්වර ස්ථාන පිළිබඳ අවබෝධය ලැබීමට බලපාන බුද්ධිය නම් කරයි.

46. දෙන ලද ස්වර ප්‍රස්තාරයට Chords යොදා අදාළ රාගය නම් කරයි.

47. මධ්‍ය ගාන්ධාරය සහ මධ්‍ය පංචමයේ සංකේතයන් වෙන වෙනම ලියයි.

48. සංගීත චිකිත්සාව සඳහා යොදා ගත හැකි ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතයෙහි නාද මාලා සහ දේශිය සංගීතයෙහි එන ගීතයන්හි නාද මාලා හඳුන්වයි.

49. රේඛාව චිත්‍රපටයේ ගී තනු හා ගී පද නිර්මාපකයන් නම් කරයි.

50. පිළිගත් සංගීත පද්ධති අතුරෙන් සංගීත පද්ධති දෙකක් නම් කරයි.

## 11 පත්‍රය

## අභිමතාර්ථ

1.)

i. ස්වර සංගති අනුව හඳුනාගත් රාග නම් කරයි.
ii. වාදි සංවාදි ස්වර අනුව රාග නම් කර ඛ්‍යාල් ගීතයක/වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරයි
iii. දීප්චන්දි තාලයේ ඨේකාව නිවැරදි සංකේත යොදා ප්‍රස්තාර කරයි.
iv. රාග ස්වර සංගති කොටසක් දීප්චන්දි තාලයට ගලපා ප්‍රස්තාර කරයි.

2.)

i. දෙන ලද රාග තොරතුරු අනුව රාග හඳුනාගෙන ඛ්‍යාල් ගීතයක/වාදිතයක ස්ථායි කොටස ප්‍රස්තාර කරයි.
ii. දී ඇති තොරතුරු අනුව රාග දෙකක අසමානතා ගොඩ නගයි.
iii. දී ඇති තොරතුරු අනුව රාග සංගති හඳුනාගෙන මාත්‍රා 16 ක තානාලංකාරයක් ද ලියයි.
iv. මාත්‍රා දහයක් වූ තාලයක ඨේකාව තාල සංකේත සහිතව ප්‍රස්තාර කරයි.

3.)

i. රාග විස්තර සහිත වගුවට සුදුසු පිළිතුරු තෝරා සම්පූර්ණ කරයි.
ii. හඳුනාගත් රාගයකට අදාළව රාගාශ්‍රිත ස්වර රචනාවක් නිර්මාණය කර ත්‍රිතාලයේ ආවර්ත දෙකකට ප්‍රස්තාර කරයි.
iii. ජෞන්පූරි, තිලක්කාමෝද්, කාලිංගඩා රාග අතුරෙන් එක් රාගයක ගානසමය නම් කර උදාහරණ දක්වයි.
iv. සම ප්‍රකෘති රාග දෙකක් නම් කර අසමානතා දක්වයි.
v. වක්‍ර ස්වරයක් යෙදෙන රාගය නම් කර අවරෝහණයේ යෙදෙන වක්‍ර ස්වරය හඳුනාගෙන ලියයි.

ii - කොටස

4.)

i. සබරගමු හා උඩරට වන්නම් සම්ප්‍රදායන් දෙක වෙන්කර නම් කරයි.
ii. සබරගමු හා උඩරට වන්නම් සම්ප්‍රදායන්හි, විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරයි.
iii. ප්‍රශස්ති ගී පිළිබඳ තොරතුරු විස්තර කරයි.
iv. ප්‍රශස්ති ගී හා හටන් ගී වල සම විෂමතා තුන බැගින් ලියයි.

5.)

i. වගුවේ රූප සටහන් අනුව භාණ්ඩ හඳුනාගෙන ඒ හා සම්බන්ධ රංග සම්ප්‍රදායන් වෙන් කරයි.
ii. උඩරට වන්නම් රංග සම්ප්‍රදායෙහි, විශේෂ ලක්ෂණ හතරක් සඳහන් කරයි.
iii. නුර්ති හා නාඩගම් සම්ප්‍රදායන්හි, සංගීතමය ලක්ෂණ හතරක් සංසන්දනය කරයි.
iv. පහතරට කෝලම් රංග සම්ප්‍රදායට අදාළ සංගීත ලක්ෂණ, රංග ශෛලිය, රඟ දක්වන ස්ථානය, චරිත සහ රංග උපකරණ විස්තර කරයි.

iii - කොටස

6.)

i. අපරදිග සංගීත ප්‍රස්තාරය අයත් ටයිම් සිග්නේචරයට (Time Signature) ගැලපෙන දේශීය තිත නම් කරයි.
ii. අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරයි.
iii. පෙරදිග ක්‍රමයට සැකසූ ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයට පරිවර්තනය කරයි.
iv. කවුන්ටර් පොයින්ට්ස්, (Counter Points) කෝඩ්ස් (Chords) ඇඩ්ලිබ් (Adlib) හාර්මනි (Harmony) යන අපරදිග සංගීතාංග දෙකක් නිදසුන් සහිතව විස්තර කරයි.

7.)

i. දී ඇති ගී පාදය තාලානුකූලව ප්‍රස්තාර කරයි.
ii. ප්‍රස්තාර කරන ලද ගී පාදයට සුදුසු තනුවක් නිර්මාණය කර ප්‍රස්තාර කරයි.
iii. නිර්මාණය කරන ලද තනුවට ගැලපෙන කෝඩ්ස් යොදයි.
iv. නිර්මාණය කරන ලද තනුවට පෙර වාදනයක් නිර්මාණය කර ප්‍රස්තාර කර ඊට ගැළපෙන හින්දුස්ථානි තාලයද, ප්‍රස්තාර කරයි.

8.)

i. රෝග සුවපත් කිරීම සඳහා සංගීතයේ සුවිශේෂී බව, සංගීතමය බුද්ධිය, චිත්‍රපට සංගීතය සඳහා දකුණු ඉන්දීය ආභාසය, මිනිස් කටහඬ පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරයි.

ii. ඛ්‍යාල් හෝ ගසල් පිළිබඳව සංගීත භාණ්ඩ, ගායන ශිල්පීන්, සංගීතමය ලක්ෂණ, භාෂා මාධ්‍ය යන කරුණු යටතේ විස්තර ඉදිරිපත් කරයි.

iii. රාගාශ්‍රිත සරල ගීතයක ආශ්‍රිත රාගයේ නාදමය ලක්ෂණ, රාගධාරී ශාස්ත්‍රීය අංග, ගායනයේ සුවිශේෂී බව, හඬ පාලනය යනාදි කරුණු යටතේ ඇගයීමක් කරයි.

iv. සිතාර්, සරෝද්, එස්රාජ්, වයලින් යන සංගීත භාණ්ඩ සඳහා සුප්‍රසිද්ධ ඉන්දියානු ශිල්පියෙකු බැගින් නම් කර එක් භාණ්ඩයක් පිළිබඳ සුවිශේෂී කරුණු හතරක් ලියයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.07 / 0830 - 1030

පෙරදිග සංගීතය I
கீழைத்தேய சங்கீதம் I
Oriental Music I

54 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..........................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 1 - 5 | |
| 02 | 6 - 14 | |
| 03 | 15 - 24 | |
| 04 | 25 - 34 | |
| 05 | 35 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

- අංක **1** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** මධ්‍යමය වාදී ස්වරය ලෙසත්, ෂඩ්ජය සංවාදී ස්වරය ලෙසත් යෙදෙන රාග යුගලය තෝරන්න.
(1) බහාර් - බිහාග් (2) තිලක්කාමොද් - මාල්කෞන්ස්
(3) බ්‍රින්දාබනී සාරංග - භීම්පලාසි (4) බාගේශ්‍රී - ආසාවරී
(5) බාගේශ්‍රී - බහාර් (05)

**2.** 'පරමේල ප්‍රවේශක' රාග යටතට ගැනෙනුයේ,
(1) දේස් රාගයයි. (2) බිහාග් රාගයයි. (3) ජයජයවන්ති රාගයයි.
(4) බාගේශ්‍රී රාගයයි. (5) ජෞනපුරී රාගයයි. (03)

**3.** 'අලංකාරික තාන' නිර්මාණයේ දී වඩාත් ප්‍රයෝජනවත් වනුයේ,
(1) රාග සංගතීන් ය. (2) රාග විස්තර ය.
(3) රාගාශ්‍රිත පල්ටා ය. (4) රාග මුඛ්‍යාංග ය.
(5) රාග ආරෝහණ - අවරෝහණ ය. (03)

**4.** සමප්‍රකෘති රාග යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) දේස් - බිහාග් (2) බිහාග් - බාගේශ්‍රී
(3) බාගේශ්‍රී - තිලක්කාමෝද් (4) තිලක්කාමෝද් - කාලිංගඩා
(5) කාලිංගඩා - භෛරව (05)

**5.** රාග ආලාප ගායනය/වාදනය සඳහා වඩාත් ම ප්‍රයෝජනවත් වනුයේ,
(1) රාග සංගතීන් ය. (2) රාග පල්ටා ය. (3) රාග ලක්ෂණ ය.
(4) රාග ගීතය ය. (5) රාග ගානසමය ය. (01)

● අංක **6** සිට **8** තෙක් ප්‍රශ්න සඳහා (තානාලංකාර සහිත වාදිතයකට අයත්) පහත ස්වර ප්‍රස්තාරය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නි ධ | - | - | ධ | නි | ධ | ස් | රි | ස් | නි | ධ | ප | - | (ප) | ග | ම |
| ධ | - | - | ධ | නි | ධ | ස් | රි | ස- | ගම | ධනි | ස්රි | ස්නි | ධප | ම්ප | ගම |
| x | | | | 2 | | | | 0 | | | | 3 | | | |

**6.** ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන රාගය කුමක් ද?
(1) බිහාග් (2) හමීර් (3) දේස්
(4) ජයජයවන්ති (5) බහාර් (02)

**7.** ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් තානාලංකාර වර්ගය කුමක් ද?
(1) අලංකාරික තාන (2) බෝල් තාන (3) සපට් තාන
(4) මිශ්‍ර තාන (5) කූට තාන (03)

**8.** ඉහත ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් කන් ස්වරය සහ මූර්කි ස්වරය පිළිවෙළින්
(1) ධ සහ ප වේ. (2) නි සහ ම වේ. (3) ප සහ නි වේ.
(4) නි සහ ප වේ. (5) ම සහ ප වේ. (04)

**9.** ගම රිස ගම ධ,ග | මරි සග මධ, ගම | රිස ගම ධ- ගම | රිස ගම ධ,ග මරි |
සග මධ, ගම රිස | ගම ධ- ගම රිස | ගම ධ,ග මරි සග | මධ, ගම රිස ගම | ධ
x 2 0 3 x

ඉහත තානාලංකාර කොටසින් පිළිබිඹු වන්නේ,
(1) මුඛඩාවක් ය. (2) තිහායි එකක් ය.
(3) ගමක් ය. (4) උපජ් ය.
(5) චක්‍රධාර් එකක් ය. (05)

**10.** තබ්ලාවෙන් වැයෙන ධා, ධිං, තිං, තා යන අවනද්ධාක්ෂර සියල්ලම යොදා ගැනෙන නිර්දේශිත තාල දෙකක් වන්නේ,
(1) ත්‍රිතාල් සහ දාදරා ය. (2) දාදරා සහ දීප්චන්දි ය.
(3) දීප්චන්දි සහ ත්‍රිතාල් ය. (4) ත්‍රිතාල් සහ ජප්තාල් ය.
(5) ජප්තාල් සහ දාදරා ය. (03)

**11.** විභාගවල මාත්‍රා සංඛ්‍යාවන් එකිනෙකට වෙනස්ව යෙදෙන, විභාග හතරකින් යුත් තාලය තෝරන්න.
(1) ජප් තාලය (2) දීප්චන්දි තාලය (3) තිලවාඩා තාලය
(4) ත්‍රිතාලය (5) ධමාර් තාලය (05)

**12.** | ධ - | නි ස් | රි ස් | නි ප | මප ගම | රිස ගම |
x 0 2 0 3 4

ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන ගත් වාදිතයෙහි රාගය සහ තාලය පිළිවෙළින්,
(1) බහාර් සහ චෞතාල් ය. (2) හමීර් සහ චෞතාල් ය.
(3) හමීර් සහ ඒක්තාල් ය. (4) බහාර් සහ ඒක්තාල් ය.
(5) ජයජයවන්ති සහ ඒක්තාල් ය. (04)

**13.** සංගීතය යනු "ගීතං වාද්‍යං තථා නෘත්‍යං ත්‍රයං සංගීතමුච්‍යතේ" ලෙස නිර්වචනය කරනු ලැබුවේ,
(1) සංගීත රත්නාකර කෘතියෙහි ය. (2) සංගීත පරිජාත කෘතියෙහි ය.
(3) බෘහත්දේශී කෘතියෙහි ය. (4) නාට්‍ය ශාස්ත්‍ර කෘතියෙහි ය.
(5) ක්‍රමික් පුස්තක් මාලිකා කෘතියෙහි ය. (01)

**14.** තත්වාද්‍ය භාණ්ඩ තුනකට අයත් ලක්ෂණ පහත දැක්වේ.
A - පර්දා සහිත ය - අඑවෙන් වැයේ
B - පර්දා රහිත ය - අඑවෙන් වැයේ
C - පර්දා සහිත ය - අඑවෙන් නොවැයේ

A, B, C සඳහා ගැළපෙන සංගීත භාණ්ඩ පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?
(1) සිතාර්, සාරංගි, එස්රාජ් (2) සිතාර්, වයලින්, එස්රාජ්
(3) එස්රාජ්, වයලින්, සරෝද් (4) එස්රාජ්, සාරංගි, සරෝද්
(5) එස්රාජ්, වයලින්, සිතාර් (05)

- පහත කරුණු ඇසුරින් **15** සහ **16** යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
  - A - මෘදංගම්
  - B - පඛාවාජ්
  - C - පල්ලවි - අනුපල්ලවි
  - D - ස්ථායි - අන්තරා
  - E - ආදි තාලම්
  - F - චෞතාල්

**15.** කර්ණාටක සංගීත පද්ධතියට අයත් කරුණු ඇතුළත් වන්නේ කුමන අක්ෂර යටතේ ද?
(1) A, B හා C (2) A, C හා E (3) B, C හා D
(4) B, D හා F (5) C, D හා E (..02..)

**16.** B සහ F යන අක්ෂර යටතේ සඳහන් කරුණු හා සම්බන්ධ ගායන ශෛලිය කුමක් ද?
(1) ධමාර් (2) ඛ්‍යාල් (3) ධ්‍රැපද් (4) චතුරංග (5) වර්ණම් (..03..)

**17.** | 1̂ 2 3 | 1́ 2 3 4 | 1̂ 2 3 | 1́ 2 3 4 | යන තාල රූපයට වාදනය කළ හැකි උඩරට බෙර පදය කුමක් ද?
(1) | ජි ං ත | කු කු ඳ ත | ජි ග ත | ග ති ග ත |
(2) | ගු ම් s | ගු ම් ද ත් | ග ත් ත | ග ත ගු ඳ |
(3) | දො ං දො | ජි ං ග ත | ජි ග ත | දො ං ත ක |
(4) | ත කු ම | ත රි කි ට | දි කු ම | ත රි කි ට |
(5) | ත ත් ත | ජි ත් ත ත් | ත ං ක | දො ං ක ඩ | (..03..)

**18.** පහත දැක්වෙන ගී පාද අතුරෙන්, ගැමි සමාජයේ 'සාමූහික බව' දනවන අවස්ථා විදහා දැක්වෙන ගී පාද තෝරන්න.
A - තෙල් ගාලා හිස පීරන් නෑනෝ
B - වෙල් යායක ගොන් දෙන්නෙක් කකා උනි
C - වරම් ගොයම් කැපුමට දෙවියන්ගෙ වරම්
D - අම්මපල්ලා බඹරුන් අත වරද නැති
E - සූරිය උදාවන තුරු පිනි බැව්ල්ල
(1) A සහ C (2) A සහ E (3) B සහ C
(4) B සහ D (5) D සහ E (..01..)

**19.** හින්දුස්ථානි රාගධාරී සංගීතයේ එන ජෞනපුරි සහ භෛරවි යන රාග පදනම්ව නිර්මාණය වූ නූර්ති ගීත දෙකක් වන්නේ පිළිවෙළින්,
(1) 'ලෝනා මුණි රාජාගේ' සහ 'අප ගුණසරු සිංහල' යන ගීතයි.
(2) 'සිරි සංඝබෝධි' සහ 'සෝබමාන දේ වපුරා' යන ගීතයි.
(3) 'මිහිරි නාද කෝකිලාදි' සහ 'සවන්දී පෙර රාම' යන ගීතයි.
(4) 'පායන මේ බැද්දෙ' සහ 'බන්දා මා දේදො' යන ගීතයි.
(5) 'දන්න වංහුං අප' සහ 'දන්නෝ බුදුන්ගේ' යන ගීතයි. (..01..)

**20.** ජන ජීවිතයේ සිදුවීම් ඇතුළත්, ආවේණික භාෂාවෙන් හා ඒකාකාරී නාදමාලාවන්ගෙන් සමන්විත වූ පැරණිතම ගීත විශේෂය කුමක් ද?
(1) ටීකා සීපද (2) සැහැලි (3) සව්දම් (4) වැදි ගීත (5) යාදිනි (..04..)

**21.** 'ගීතයක් මධ්‍යයේ හෝ අග හෝ තනුවකට අනුව තාලානුකූලව බෙරපද ගායනා කරන ගීත විශේෂය කුමක් ද?
(1) හටන් (2) මංගලම් (3) අස්නෙ (4) වන්නම් (5) ප්‍රශස්ති (..05..)

**22.** දීර්ඝ යති යෙදෙන අඩු ලයකින් යුතුව, කාන්තාවන් විසින් ගයනු ලබන මෙහෙ ගී විශේෂය කුමක් ද?
(1) වරම් ගී (2) ගොයම් ගී (3) නෙළුම් ගී (4) කමත් ගී (5) ඇල් ගී (..03..)

**23.** තුන්සුළු දෙමහ පස්තිතට අනුව ගැයෙන උඩරට නර්තන අංගයක් වන්නේ,
(1) අස්නෙ ය. (2) මංගලම් ය.
(3) කොහොඹා හැල්ල ය (4) වට්ටම් ය.
(5) වන්නම් ය. (..02..)

**24.** "බාල මෙ මගෙ වැරදි නොගන් - මෙම රාළහාමිලා මට ආයුබෝවන්" යන ගීතය ගයනු ලබන කෝලම් චරිතය කුමක් ද?
(1) සඳ කිඳුරිය (2) ජසයා (3) නොංචි අක්කා
(4) ලෙන්චිනා (5) මුදලි (..04..)

**25.**




ඉහත ස්වර පුවරු රූපසටහනේ ලකුණු කර ඇති ස්වර **ත්‍රිත්වය** එක්වර වැයෙන විට නිකුත් වන අපරදිග ස්වර සංචය (CHORD) නම් කරනුයේ,

(1) C major යනුවෙනි. (2) C minor යනුවෙනි.
(3) D major යනුවෙනි. (4) D minor යනුවෙනි.
(5) C diminished යනුවෙනි. (**04**)

● අංක **26** සිට **30** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**26.** සමූහ වාදන සහ සමූහ ගායන යන අංග දෙකම යොදා ගනු ලබන බටහිර සංගීතාංගය නම් කරන්නේ කෙසේ ද?
**කැන්ටාටා**

**27.** 'සූත්‍රධාරී' යන චරිතය ඇතුළත් රංග ශෛලිය නම් කරන්න.
**නූර්ති**

**28.** ගී පද, සර්ගම්, තිර්වට්, තරාණා අංග සියල්ල ඇතුළත් ගායන ශෛලිය කුමක් ද?
**චතුරංග**

**29.** 'සැක්සෆෝනය' සිංගල් රීඩ් (Single reed) වර්ගයට අයත් වේ. එසේම, 'බැසූන්' සහ 'ඕබෝ' යන සුෂිර වාද්‍ය භාණ්ඩ අයත් වන වර්ගය නම් කරන්න.
**ඩබල්රීඩ්**

**30.** ෆ්ලැට් ස්වර හෝ ෂාප් ස්වර කිසිවක් **නොයෙදෙන** මයිනර් ස්කේලය කුමක් ද?
**A මයිනර්**

● අංක **31** සිට **34** තෙක් ප්‍රශ්න සඳහා පහත ඡේදය කියවා පිළිතුරු සපයන්න.

සංගීත ප්‍රසංගයක දී නිපුනි විසින් අළුවෙන් (Bow) වැයෙන, පර්දා නොමැති සිය සංගීත භාණ්ඩයේ අනුනාද සුසර කර ගනිමින්, අ. පො. ස. (උසස් පෙළ) සඳහා නිර්දේශිත රාගයකින් ඉදිරිපත් කරන ලද වාදිතයේ, අන්තරා කොටස, | මපනි | ස-සස | රි රිග් රි | ස - නිධ | ලෙස, එක් තතක් මත ඇඟිලිවල නියපොතු ඝර්ෂණය කරමින් වැයී ය.

**31.** නිපුනි විසින් වැයූ රාගය අයත් මේලය **බමාජ්** නමින් හැඳින්වෙන අතර, එම රාගයේ ජාතිය **සම්පූර්ණ** වේ.

**32.** ඉහත වාදිතයේ කෝමල ගාන්ධාරය විවාදි වූයේ නම්, ඇය වැයුවේ **දේස්** රාගය වන අතර කෝමල ගාන්ධාරය ආංගිකව යෙදුවේ නම්, ඇය වැයුවේ **ජයජයවන්ති** රාගයයි.

**33.** 'නිපුනි' වැයූ භාණ්ඩය **සාරංගි** නමින් හැඳින්වෙන අතර ඉහත ඡේදයෙහි විස්තරය අනුව අළුව වෙනුවට වෙනත් උපකරණයක් යොදා ගත්තේ නම් ඇය වැයූ භාණ්ඩය **සරෝද්** ලෙස නම් කළ හැකි ය.

**34.** එම වාදිතය සඳහා වැයූ තාලය **දීප්චන්දි** නමින් හැඳින්වෙන අතර, එම තාලය වැයූ වාද්‍ය භාණ්ඩය **තබ්ලාව** නමින් හැඳින් වේ.

- අංක **35** සිට **50** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**35.** 'පන්කජ් උදාස්' නම් භාරතීය ගායන ශිල්පියා ........**ගසල්**........ ගායන ශෛලියට සුප්‍රසිද්ධ වේ. 'පායෝජී මෛනේ රාම රතන' ගීතය ........**භජන්**........ ගායන ශෛලියට අයත් ය.

**36.** උස්තාද් බිස්මිල්ලා ඛාන් ....**ෂෙනායි**........ නමැති සංගීත භාණ්ඩය වාදනය සඳහා සුප්‍රසිද්ධ වන අතර, පණ්ඩිත් ශිවකුමාර් ශර්මා ........**සන්තූර්**........ නමැති සංගීත භාණ්ඩය වාදනය සඳහා සුප්‍රසිද්ධ වේ.

**37.** 'හෙළ ගී මග' කෘතිය ........**ඩබ්.බී. මකුලොලුව**........ මහතා විසින් ද, ක්‍රමික් පුස්තක් මාලිකා කෘති පෙළ ....**භාත්කන්ඩෙ පඬිතුමා**.... විසින් ද රචනා කරන ලදී.

**38.** 'සත් සමුදුර' චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය ........**සෝමදාස ඇල්විටිගල**........ සූරීන්ගේ වන අතර එහි තේමා ගීතය ගායනා කරන ලද්දේ ........**ඩබ්.ඩී. අමරදේව**........ සූරීන් විසිනි.

**39.** ග ස රි ම, ම රි ග ප, වශයෙන් ආරෝහණයට පිළිවෙළින් යෙදෙන ස්වර අභ්‍යාස රටාවේ ඊළඟ පියවරට අයත් ස්වර හතර ..**පගමධ**.. වන අතර, එහි අවරෝහණ රූපයට අනුව යෙදෙන ප්‍රථම පියවරෙහි ස්වර හතර ....**ධසනිප**.... වේ.

**40.** පහත දැක්වෙන එක් එක් ස්වර ඛණ්ඩය ඉදිරියෙන් එය අයත් වන නිර්දේශිත රාගය නම් කරන්න.

(a) ස නි̣ ධ̣ නි̣ ස ම, ........**මාලකෞන්ස්**........

(b) ස නි̣ ධ̣ නි̣ ස ම, ........**බාගේශ්‍රී**........

**41.** ධා ධා තිට | ධා ධා තු නා | තා තා තිට | ධා ධා තු නා | වශයෙන් වැයෙන කායදාව අයත් වන තාලය....**ත්‍රිතාලය**.... නමින් හැඳින්වෙන අතර ධා ධා තිට ධා ධා තු නා | ධා +, වශයෙන් වූ අවනද්ධාක්ෂර තෙවරක් වාදනය කිරීම ....**තිහායි**.... නමින් හැඳින්වේ.

**42.** කවිකාර මඩුවෙහි සේවය කළ කර්ණාටක සංගීතඥයින් වන අලගනායිදු, නාරසිංහ සහ ....**ගණිතාලංකාර**.... යන තිදෙනා අතුරෙන් අලගනායිදු විසින් ........**හරිශ්චන්ද්‍ර**........ නම් වූ නාඩගම නිර්මාණය කරන ලද බව සඳහන් වේ.

**43.** සිංහල ගීතයක් කණ්ඩායම් සංගීතය සඳහා ප්‍රථම වරට යොදාගත් සංගීත කණ්ඩායමේ නම ....**ලොස්කැබෙලෙරෝස්**.... වන අතර එම කණ්ඩායමේ නායකයා ........**නෙවිල් ප්‍රනාන්දු**........ නම් වේ.

**44.** නාඩගමක චරිත දෙකක් අතර යෙදෙන සංවාදාත්මක ගී පද කොටස........**තර්ගය**........ නමින් හැඳින්වේ. ඒ සඳහා උදාහරණයක් ලෙස ........**ඉව්ජින්**........ නාඩගමෙහි ගැයෙන 'යානත අතුල මල්පෙති' ගීතය සඳහන් කළ හැකි ය.

**45.** ඇමෙරිකානු ජාතික ........**හොවාර්ඩ් ගාඩ්නර්**........ නම් මනෝවිද්‍යාඥයා විසින් හඳුන්වා දුන් 'බහුවිධ බුද්ධිය' සිද්ධාන්තය අනුව ස්වර ස්ථාන පිළිබඳ අවබෝධය ඇති වීමට ........**සංගීතමය බුද්ධිය හෝ සංගීත රිද්මයානුකූල**........ බුද්ධිය හේතු වේ.

**46.** | ස ග ප | ධ ම රි | නි ප රි | ස - - | ස්වර ප්‍රස්තාරයට අදාළ කෝඩ්ස් (Chords) පිළිවෙළින් විභාග හතර මත යෙදෙනුයේ ....**CFGC**.... ලෙස වන අතර, ඉන් පිළිබිඹු වන හින්දුස්ථානි තාලය ....**දාදරා**.... නම් වේ.

**47.** 'මධ්‍ය සඩ්ජ' ස්වරයේ සංඛ්‍යාතය හර්ට්ස් 256 වන්නේ නම් ඊට අදාළ ව 'මධ්‍ය ගාන්ධාරයේ' සංඛ්‍යාතය හර්ට්ස් ....**320**.... ලෙස ද, මධ්‍ය පංචමයේ සංඛ්‍යාතය හර්ට්ස් ....**384**.... ලෙස ද වේ.

**48.** සංගීත චිකිත්සාව සඳහා ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතයෙහි ....**රාග**.... හා බැඳි නාදමාලාවන්ද, මෙරට දේශීය සංගීතයෙහි නැලවිලි ගීත සහ ....**ශාන්තිකර්ම**.... ගීතයන්හි එන නාදමාලාවන් ද යොදාගෙන ඇත.

**49.** දේශීය චිත්‍රපට කලාවේ සන්ධිස්ථානයක් වන රේඛාව චිත්‍රපටයේ ස්වතන්ත්‍ර තනු නිර්මාණය ....**සුනිල් සාන්ත**.... විසින් ද ගීත ප්‍රබන්ධය....**මර්සලීන් ජයකොඩි**.... විසින් ද සිදු කරන ලදී.

**50.** පිළිගත් සංගීත පද්ධති ලෙස සලකනු ලබනුයේ පෙරදිග, අපරදිග, ....**චීන**...., ඉස්ලාමික් සහ ....**ගම්ලෑන් (ගම්ලාන්)**.... නම් වූ සංගීත පද්ධතීන් ය.

**(ගම්ලෑන් හෝ චීන වශයෙන් පිළිතුරු මාරුවී ඉදිරිපත් කළ හැකිය)**

* * *

**1.** පහත දී ඇත්තේ නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගති කොටස් කිහිපයකි.

**A** - රිමප නිස් නිනිප

**B** - ගමප නිස් නිනිප

**C** - රිමප නිස් නිධප

**D** - ගමප නිස් නිධප

(i) ඉහත රාග හතර හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂර ද සමග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 08 යි.)

(ii) ඉහත රාග අතුරෙන් 'රිෂභය' සහ 'පංචමය' පිළිවෙළින් වාදී සහ සංවාදී ලෙස යෙදෙන රාග **දෙකක්** නම් කර, ඉන් **එක්** රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 07 යි.)

(iii) 'දීප්චන්දි' තාලයේ ඨේකාව සමගුණයෙන් තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 03 යි.)

(iv) ඉහත **B** හි සඳහන් ස්වර සංගති කොටස, දීප්චන්දි තාලයේ එක් ආවර්තයකට ගළපා ප්‍රස්තාර කරන්න. (ලකුණු 02 යි.)

(i) ඉංග්‍රීසි අක්ෂරය සමග රාග හතර පිළිවෙලින් නම් කිරීමට (ල.2x4) **ලකුණු** 08

(ii)

- රාග දෙක නම් කිරීමට ල. 02
- එක් රාගයකට අයත් මධ්‍ය ලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ප්‍රස්තාර කිරීමට (ස්වර පාද දෙකක් තිබිය යුතුය. එක් විභාගයකට ලකුණු 00½ බැගින් හිමිවේ.) ල. 04
- තාල සංකේත ලකුණු කිරීමට ල. 01

**ලකුණු** 07

(iii)

- දීප්චන්දි තාලයේ ඨේකාව ප්‍රස්තාර කිරීමට ල. 02
- තාල සංකේත ලකුණු කිරීමට ල. 01

**ලකුණු** 03

(iv) B හි සඳහන් ස්වර සංගතිය දීප්චන්දි තාලයේ එක් ආවර්තයකට ගලපා ලිවීමට **ලකුණු** 02

(නිවැරදි විභාගයකට ලකුණු 00½ බැගින් හිමිවේ) **මුළු ලකුණු 20 කි.**

i. a) - බ්‍රින්ද්‍රාමනි සාරංග රාගය

b) - බිහාග් රගය

c) - දේස් රාගය

d) - ජයජයවන්ති රාගය

ii. බ්‍රින්දාමනී සාරංග රාගය, දේස් රාගය, ජයජයවන්ති රාගය

- ඉහත රාග අතුරින් එක් රාගයකට අදාළව ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස තාල සංකේත සහිතව ප්‍රස්තාර කර තිබිය යුතුය.

iii. තාල සංඥා x 2 o 3

| | | | | |
|---|---|---|---|---|
| තාල සංඥා | x | 2 | o | 3 |
| මාත්‍රා | 1 2 3 / | 4 5 6 7 / | 8 9 10 / | 11 12 13 14 |
| ඨේකාව | ධා ධිං - / | ධා ධා ධිං - / | ධා තිං - / | ධා ධා ධිං - / |
| | ධා ධිං - / | ධා ධා තිං - / | තා තිං - / | ධා ධා ධිං - / |
| | ධා ධිං - / | ධා ධා ධිං - / | තා තිං - / | ධා ධා ධිං - / |

iv. B හි සඳහන් ස්වර සංගතිය (ගමප නිස නිනිප) දීප්චන්දි තාලයේ එක් ආවර්තයකට ගලපා ලියා තිබිය යුතුය.

(i)

**2.** නිර්දේශිත රාග හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත **A, B, C** යටතේ දක්වා ඇත.

**A** - 'මධ්‍යම' ස්වරය වාදී ලෙස ද 'සඩ්ජ' ස්වරය සංවාදී ලෙස ද යෙදේ.

**B** - රාගයට නියමිත ආරෝහණයේ ස්වර යෙදීමේ පිළිවෙළ අනුව 'පංචම' ස්වරය වර්ජ්‍ය වේ.

**C** - රාගයට නියමිත අවරෝහණයේ 'රිෂභ' ස්වරය යෙදේ.

(i) **A** හා **B** හි කරුණු **දෙකට ම අදාළ වන** නිර්දේශිත රාග **දෙකක්** නම් කර, ඉන් **එක්** රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 07 යි.)

(ii) **A** හා **C** හි කරුණු **දෙකට ම අදාළ වන** නිර්දේශිත රාග **දෙකක්** නම් කර, එම රාග දෙක අතර අසමානතා **හතරක්** උදාහරණ සහිතව පෙළගස්වන්න. (ලකුණු 06 යි.)

(iii) **A, B** හා **C** හි කරුණු **තුනට ම අදාළ වන** රාගය නම් කර, එම රාගයට අයත් රාග සංගති **දෙකක්** සහ මාත්‍රා 16 කට නොඅඩු තානාලංකාරයක් ලියන්න. (ලකුණු 04 යි.)

(iv) මාත්‍රා දහයකින් යුත් නිර්දේශිත තාලයක ඨේකාව සමගුණයෙන් තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 03 යි.)

(i)

- ඉංග්‍රීසි A හා B යන කරුණු වලට අදාළ රාග දෙක නම් කිරීමට ල. 02
- එක් රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කිරීමට ල. 04
  (ස්වර පාද දෙකක් තිබිය යුතුය. එක් විභාගයකට ලකුණු 00½ බැගින් හිමිවේ.)
- තාල සංකේත ලකුණු කිරීමට ල. 01

**ලකුණු 07**

(ii)

- ඉංග්‍රීසි A හා C යන කරුණු වලට අදාළ රාග දෙක නම් කිරීමට ල. 02
- එම රාග දෙක අතර අසමානතා හතරක් ලිවීමට ල. 04

**ලකුණු 06**

(iii)

- ඉංග්‍රීසි A B හා C යන කරුණු තුනට අදාළ පොදු රාගය නම් කිරීමට ල.01
- එම රාගයට අදාළ ස්වර සංගති දෙකක් ලිවීමට ල. 01
- එම රාගයට අදාළ මාත්‍රා 16 කට නොඅඩු තානාලංකාරයක් ලිවීමට ල. 02

**ලකුණු 04**

(iv)

- මාත්‍රා 16 කින් යුත් තාලයක ඨේකාව ප්‍රස්තාර කිරීමට ල. 02

තාල සංකේත ලකුණු කිරීමට ල. 01

**ලකුණු 03**

**මුළු ලකුණු 20**

2.

(i) **බාගේශ්‍රී හා මාලකෞන්ස්**

ඉහත එක් රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස තාල සංකේත සහිතව නිවැරදිව ස්වර ප්‍රස්තාර කර තිබිය යුතු වේ.

(ii) **බාගේශ්‍රී, බහාර්, භීම්පලාසි**

ඉහත දැක්වෙන රාග අතරින් රාග දෙකක් නම් කර එම රාග දෙක අතර ඇති අසමානතා හතරක් උදාහරණ සහිතව පෙළ ගස්වා තිබිය යුතුයි.

❖ **බාගේශ්‍රී හා බහාර් යන රාග අතර ඇති අසමානතා**

| බාගේශ්‍රී | බහාර් |
|---|---|
| • ආරෝහණ අවරෝහණ අසමානය. | |
| **ආරෝ:- සනිධනිස, මග, මධනිස**<br>**අවරෝ:- සනිධම,ග, මගරිස** | **ආරෝ:- නිසගම,පගම,ධනිස**<br>**අවරෝ:- සනිප,මපගම, රිස** |
| • මුඛ්‍යාංග අසමානය. | |
| මුඛ්‍යාංග :- සනිධස, මධනිධ, මගරිස | මුඛ්‍යාංග :- මපගම, ධනිස |
| • ජාතිය අසමානය | |
| ෂාඩව සම්පූර්ණ/ ෂාඩව / සම්පූර්ණ | ෂාඩව |
| ශුද්ධ නිෂාදය ඇතැම් විට විවාදි ස්වරයක් ලෙස යෙදේ. | ආරෝහණයේදී ශුද්ධ නිෂාදය ආංගිකව යෙදේ. |
| පංචමය ආගන්තුක ස්වරයකි. | පංචමය ආංගික ස්වරයකි. |
| ධෛවතය ආරෝ/අවරෝහණ දෙකෙහිම යෙදේ. | ධෛවතය යෙදෙන්නේ ආරෝහණයේ පමණි. |
| වක්‍ර ස්වර නොයෙදේ. | නිපමපගමරිස.. ලෙස අවරෝහණයේ මධ්‍යමය හා කෝමළ ගාන්ධාරය වක්‍රව යෙදේ. |
| සප්තක තුනම ඇසුරු කෙරේ. | මධ්‍ය හා තාර සප්තක වැඩි වශයෙන් ඇසුරු කෙරේ. |
| • රාග භාවයන් රාග දෙකෙහිම එකිනෙකට වෙනස්ව යෙදේ.<br>• යොදා ගැනෙන ඇතැම් රාග සංගති රාග දෙකෙහි වෙනස්ව යෙදේ. | |

❖ **භිම්පලාසි හා බහාර් යන රාග අතර ඇති අසමානතා**

| භිම්පලාසි | බහාර් |
|---|---|
| • ආරෝහණ අවරෝහණ අසමානය. | |
| **ආරෝ:- නිසගම, ප, නිස**<br>**අවරෝ:- සනිධප, මගරිස** | **ආරෝ:- නිසගම,පගම,ධනිස**<br>**අවරෝ:- සනිප,මපගම, රිස** |
| • මුඛ්‍යාංගය අසමානය. | |
| මුඛ්‍යාංග :-නිසම, මගප, මග, මගරිස | මුඛ්‍යාංග :- මපගම, ධනිස |
| • ජාතිය අසමානය | |
| ඖඩව - සම්පූර්ණ | ෂාඩව |
| ගානසමය අසමානය | |
| දිවා තුන්වන ප්‍රහරය | මධ්‍යම රාත්‍රිය |
| ධෛවතය ආරෝහණයේ නොයෙදේ. | ධෛවතය යෙදෙන්නේ ආරෝහණයේ පමණි. |
| වක්‍ර ස්වර නොයෙදේ. | නිපමපගමරිස.. ලෙස අවරෝහණයේ මධ්‍යමය හා කෝමළ ගාන්ධාරය වක්‍රව යෙදේ. |
| • රාග භාවයන් රාග දෙකෙහිම එකිනෙකට වෙනස්ව යෙදේ.<br>• යොදා ගැනෙන ඇතැම් රාග සංගති රාග දෙකෙහි වෙනස්ව යෙදේ. | |

❖ **බාගේශ්‍රී හා හිම්පලාසි යන රාග අතර ඇති අසමානතා**

| බාගේශ්‍රී | හිම්පලාසි |
|---|---|
| • ආරෝහණ අවරෝහණ අසමානය. | |
| **ආරෝ:- සනිධනිස, මගු, මධනිස්**<br>**අවරෝ:- සනිධම,ග, මගරිස** | **ආරෝ:- නිසගම,පනිස**<br>**අවරෝ:- සනිධප,මගරිස** |
| • මුඛ්‍යාංගය අසමානය. | |
| මුඛ්‍යාංග :- සනිධස, මධනිධ, මගරිස | මුඛ්‍යාංග :-නිසම, මග, පමග, මගරිස |
| • ජාතිය අසමානය | |
| ෂාඩව සම්පූර්ණ/ ෂාඩව / සම්පූර්ණ | ඖඩව-සම්පූර්ණ |
| ශුද්ධ නිෂාදය ඇතැම් විට විවාදි ස්වරයක් ලෙස යෙදේ. | ශුද්ධ නිෂාදය නොයෙදේ. |
| පංචමය ආගන්තුක ස්වරයකි. | ආරෝ/අවරෝහණ දෙකෙහිම පංචමය ආංගික ස්වරයකි. |
| ධෛවතය ආරෝ/අවරෝහණ දෙකෙහිම යෙදේ. | ආරෝහණයේ ධෛවතය වර්ජ්‍ය වේ. |
| ගානසමය අසමානය | |
| රාත්‍රී තුන්වන ප්‍රහරය/මධ්‍යම රාත්‍රී | දිවා තුන්වන ප්‍රහරය |
| • රාග භාවයන් රාග දෙකෙහිම එකිනෙකට වෙනස්ව යෙදේ.<br>• යොදා ගැනෙන ඇතැම් රාග සංගති රාග දෙකෙහි වෙනස්ව යෙදේ. | |

(iii) **බාගේශ්‍රී රාගය**

ඉහත කරුණු තුනටම අදාළ රාගය වන බාගේශ්‍රී රාගයට අයත් **ස්වර සංගති දෙකක් හා මාත්‍රා 16 කට නොඅඩු තානාලංකාරයක්** නිවැරදිව ලියා තිබිය යුතු වේ.

(iv) ජප්තාලයේ ඨේකාව තාල සංකේත සහිතව සමගුණයෙන් ප්‍රස්තාර කර තිබිය යුතුය.

**3.** පහත දැක්වෙනුයේ සමප්‍රකෘති රාග තුනකට අදාළ වගුවකි.

| රාගය | මේලය | ජාතිය | වාදී - සංවාදී | විකෘති ස්වර |
|---|---|---|---|---|
| ....A.... | ආසාවරී | ෂාඩව - සම්පූර්ණ | ....G.... | ගු ධු නි |
| ....B.... | ....D.... | ....E.... | රි - ප | නැත |
| ....C.... | භෛරව | ....F.... | ප - ස | ....H.... |

(i) ඉහත වගුවෙහි A සිට H තෙක් ඇති හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරයද සමග පිළිතුරු පත්‍රයේ ලියන්න. (ලකුණු 08 යි.)

(ii) වගුවෙහි තොරතුරු අනුව හඳුනාගත් රාග අතුරෙන් **එක්** රාගයකට අදාළව රාගාශ්‍රිත ස්වර රචනාවක්, ත්‍රිතාලයේ ආවර්ත **දෙකක්** සම්පූර්ණ වන ලෙස නිර්මාණය කර, ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iii) A, B, C සඳහා ගැළපෙන රාග අතුරෙන් **එක්** රාගයක ගානසමය නම් කර, එම ගානසමය තීරණය කිරීමට හේතු වුන කරුණු **දෙකක්** උදාහරණ සහිතව ලියන්න. (ලකුණු 03 යි.)

(iv) ඉහත වගුවෙහි විස්තර අනුව හඳුනාගත හැකි රාග දෙකකට අදාළ සමප්‍රකෘති රාග **දෙකක්** නම් කර, ඉන් **එක්** සමප්‍රකෘති රාග යුගලයක **අසමානතා දෙකක්** ලියන්න. (ලකුණු 03 යි.)

(v) A, B, C සඳහා ගැළපෙන රාග අතුරෙන් වක්‍ර ස්වර යෙදෙන රාගය නම් කර, අවරෝහණයෙහි යෙදෙන වක්‍ර ස්වරය ලියන්න. (ලකුණු 02 යි.)

(i) A සිට H දක්වා හිස් තැන් වලට ගැළපෙන පිළිතුරු ලිවීමට **ලකුණු** 08

(ii) තොරතුරු වලට අදාළව හඳුනාගත් රාගයට අනුව රාගාශ්‍රිත ස්වර රචනාවක් ත්‍රිතාලයේ ආවර්ත දෙකක් සම්පූර්ණ වනසේ නිර්මාණය කර ප්‍රස්තාර කිරීමට **ලකුණු** 04
(නිවැරදි විභාගයකට ලකුණු 00½ බැගින් හිමිවේ)

(iii)

- A B C යන රාග අතුරින් එක් රාගයක ගානසමය ලිවීමට ල. 01
- ගාන සමය තීරණය කිරීමට හේතු වන කරුණු උදාහරණ සහිතව ලිවීමට ල. 02 } **ලකුණු** 03
(උදාහරණ සපයා නොමැති විට ල. 01 ක් හිමිවේ.)

(iv)

- වගුවේ විස්තර අනුව සමප්‍රකෘති රාග දෙකක් නම් කිරීමට ල. 01 } **ලකුණු** 03
- සමප්‍රකෘති රාග යුගලයේ අසමානතා දෙකක් ලිවීමට ල. 02

(v)

- A B C රාග අතුරින් වක්‍ර ස්වරය යෙදෙන රාගය නම් කිරීමට ල. 01 }
- ඉහත රාගයේ අවරෝහණයේ යෙදෙන වක්‍ර ස්වර ලිවීමට ල. 01 **ලකුණු** 02

**මුළු ලකුණු** 20

(i)

A. ජෞන්පූරි

B. තිලක්කාමෝද්

C. කාලිංගඩා

D. ඛමාජ්

E. ෂාඩව සම්පූර්ණ

F. සම්පූර්ණ

G. කෝමළ ධ කෝමළ ග

H. කෝමළ රි කෝමළ ධ

(ii) හඳුනාගත් රාග අතුරින් එක් රාගයකට අදාළ රාගාශ්‍රිත ස්වර රචනාවක් ත්‍රිතාලයෙහි ආවර්ත දෙකක් සම්පූර්ණ වන පරිදි නිර්මාණය කර ප්‍රස්තාර කර තිබිය යුතුයි.

(iii)

A. – දිවා දෙවන ප්‍රහරය

B. - රාත්‍රි දෙවන ප්‍රහරය

C. - රාත්‍රි අන්තිම ප්‍රහරය ( උදය සන්ධි ප්‍රකාශ සමය)

(iv) සම ප්‍රකෘති රාග :-

- ජෞන්පූරී - ආසාවරී
- තිලක්කාමෝද් - දේස්
- කාලිංගඩා - භෛරව

❖ සම ප්‍රකෘති රාග අතර අසමානතා

| ජෞනපූරී | ආසාවරී |
|---|---|
| රාග දෙකෙහිම ආරෝහණ අවරෝහණ අසමානය. | |
| ආරෝඃ ස, රිමප,ධ,නි ස<br>අවරෝඃ- ස නිධප, මගරිස | ආරෝඃ ස, රිමප,ධ ස<br>අවරෝඃ- ස නිධප මගරිස |
| රාග දෙකෙහිම ජාතිය වෙනස් ය. | |
| ෂාඩව - සම්පූර්ණ | ඖඩව - සම්පූර්ණ |
| ආරෝහණ ගාන්ධාරය වර්ජිතය. | ආරෝහණ ගාන්ධාරය හා නිෂාදය වර්ජිතය. |
| ආරෝහණයේ නිශාදය යෙදේ. | ආරෝහණයේ නිෂාදය නොයෙදේ. |
| රාග දෙකෙහිම මුඛ්‍යාංගය අසමානය. | |
| මප, නිධප, මපග, රිමප | රිම, පනිධප |
| ජන්‍ය රාගයකි. | ජනක රාගයකි. |
| රාග දෙකෙහි භාවයන් වෙනස් වේ.<br>න්‍යාස ස්වර යෙදෙන ආකාරය වෙනස් වේ.<br>රාග දෙකෙහි යෙදෙන ඇතැම් රාග සංගතීන් එකිනෙකට වෙනස්ය. | |

| තිලක්කාමෝද් | දේස් |
|---|---|
| රාග දෙකෙහිම ආරෝහණ අවරෝහණ අසමානය. | |
| ආරෝඃ සරිගස, රිමපධ, මප ස<br>අවරෝඃ- ස, පධමග, සරිගසනි | ආරෝඃ- ස, රිමප,නි ස<br>අවරෝඃ- ස නිධප මගරිගස |
| රාග දෙකෙහිම ජාතිය වෙනස් ය. | |
| ෂාඩව - සම්පූර්ණ | සම්පූර්ණ |
| ආරෝහණ/අවරෝහණයේ ස්වර ශුද්ධව යෙදේ. | අවරෝහණයේ නිෂාදය කෝමළ වේ. |
| න්‍යාස ස්වර යෙදෙන ආකාරය වෙනස් වේ. | |
| නිෂාදය න්‍යාස වේ | රිෂභය න්‍යාස වේ. |
| රාග දෙකෙහිම මුඛ්‍යාංගය අසමානය. | |
| පනිසරි,ගස, රිපමග සරිගසනි | රිමප, නිධප |
| විවාදි ස්වර නොයෙදේ. | කෝමළ ගාන්ධාරය විවාදිව යෙදේ. |
| රාග දෙකෙහි භාවයන් වෙනස් වේ. | |
| රාග දෙකෙහි යෙදෙන ඇතැම් රාග සංගතීන් එකිනෙකට වෙනස්ය. | |

| කාලිංගඩා | භෛරව |
|---|---|
| රාග දෙකෙහිම වාදි සංවාදි ස්වර අසමානය. | |
| වාදිඃ- පංචම සංවාදිඃ- ෂඩ්ජ | වාදිඃ- කෝමළ ධෛවත/සංවාදිඃ-කෝමළ රිෂභ |
| රාග දෙකෙහි අන්තරා ආරම්භ වන ස්වර වෙනස් ය. | |
| පධ නිස/ පධ පධ නිනිස | ගම ධධනි ස |
| රාග දෙකේ ස්වර සංගතීන් වෙනස් ය. | |
| නි සරි ග .... ම | නි ස ග ම රි ස |
| රාග දෙකෙහිම මුඛ්‍යාංගය අසමානය. | |
| ධප, ගමග,නි,සරිග ම | ස, ග,මප,ධප |
| ජන්‍ය රාගයකි. | ජනක රාගයකි. (ථාට්/ආශ්‍රය) |
| රාග දෙකෙහි භාවයන් වෙනස් වේ. | |
| වක්‍ර ස්වර නොයෙදේ. | ගාන්ධාරය වක්‍ර වේ. (මගමරිස) |
| ආධුනික රාගයකි. | ප්‍රාචීන රාගයකි. |

**4.** පහත A සහ B හි දැක්වෙන්නේ වන්නම් **දෙකකට** අයත් කරුණු ය.

A - තානම, කවිය, කලාසම, අඬව්ව

B - තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඬව්ව

(i) A සහ B හි සඳහන් කරුණු සම්බන්ධ වන්නම් සම්ප්‍රදායන් **දෙක** වෙන් වෙන්ව නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) එම එක් එක් වන්නම් සම්ප්‍රදායෙහි විශේෂ ලක්ෂණ **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(iii) 'ප්‍රශස්ති ගී' පිළිබඳ පහත සඳහන් කරුණු ඇසුරෙන් විස්තරයක් කරන්න.

- ආරම්භය හා ව්‍යාප්තිය
- සංගීත ආභාසය
- භාවිත කළ සංගීත භාණ්ඩ
- ඉන්දියානු සංගීතඥයෝ (ලකුණු 08 යි.)

(iv) ප්‍රශස්ති ගී හා හටන් ගීවල සමානතා **තුනක්** සහ අසමානතා **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

i. A හා B හි සඳහන් වන්නම සම්ප්‍රදායන් දෙක නම් කිරීමට **ලකුණු** 02

ii. වන්නම් සම්ප්‍රදායන් දෙකේ විශේෂ ලක්‍ෂණ දෙක බැගින් ලිවීමට (ල.02x2= 04යි) **ලකුණු** 04

iii. දී ඇති කරුණු හතරක් ඇසුරින් ප්‍රශස්ති පිළිබඳ විස්තරයක් ලිවීමට (ල.02x4) **ලකුණු** 08

iv. ප්‍රශස්ති හා හටන් ගී වල සමානතා 3 ක් හා අසමානතා 3 ක් ලිවීමට (ල.01x6) **ලකුණු** 06

**මුළු ලකුණු** 20

i.

A - සබරගමු වන්නම්

B - උඩරට වන්නම්

## ii. A සබරගමු වන්නම් සම්ප්‍රදායන්හි විශේෂ ලක්‍ෂණ

- දවුල ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වීම.
- කලවානේ ධර්මාලංකාර අතපත්තු මුදලි විසින් නිර්මාණය කළ බවට සඳහන් වීම.
- දවුල් පදය, තානම, කවිය, කලාසම සහ අඩව්ව යන කොටස් වලින් යුක්ත වීම.
- සබරගමු වන්නම් නාමිකව 24 ක් වුවත්, 18 ක් භාවිතයේ පැවතීම.
- කෑගල්ල, රත්නපුර ආදි සබරගමු පළාතට අයත් ප්‍රදේශ වල ව්‍යාප්ත වීම.
- කෝකිල, ආනන්ද, තිසරා ආදි වශයෙන් නම් කළ හැකි වීම.
- විනෝදාස්වාදය සඳහා නිර්මාණය වී තිබීම.
- දේශීය තිත් ක්‍රමය මත නිර්මාණය වීම.
- සබරගමු නර්තන සම්ප්‍රදාය ට අයත් වීම.

## B උඩරට වන්නම්

- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු සමයේ උඩරට වන්නම් නිර්මාණය වීම.
- දක්ෂිණ භාරතීය සංගීතයේ ආභාසය ලැබීම.
- ''ගණිතාලංකාර'' නම් දක්ෂිණ භාරතීය සංගීතඥයාගේ දායකත්වය ලැබීම.
- මහනුවර ''කවිකාර මඩුව'' ආශ්‍රයෙන් ගොඩ නැගීම.
- ''ගැටබෙරය'' ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වීම.
- තානම, කවිය, කස්තිරම, සීරුමාරුව හා අඩව්ව යනුවෙන් කොටස් පහකින් යුක්ත වීම.
- වන්නම් දහ අටක් භාවිතයේ පැවතීම
- දේශීය තිත් ක්‍රමය මත උඩරට වන්නම් ගොඩ නැගීම.
- විවිධ තිත් රූප මත නිර්මාණය වීම.

## iii. ප්‍රශස්ති ගී

### ❖ ආරම්භය හා ව්‍යාප්තිය

- කෝට්ටේ යුගයේ දි ආරම්භ වී මහනුවර යුගයේ දී ව්‍යාප්ත වූ සේ ගී විශේෂයකි.
- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු සමයේ ප්‍රශස්ති ගී රාශියක් නිර්මාණය වීම හා ව්‍යාප්ත වීම, සිදුව ඇත.
- රජ වාසල කවිකාර මඩුවේ දී ගැයූ ගිත විශේෂයක් වීම.

❖ **සංගීත ආභාසය**

- රජවරුන්, ප්‍රභූන් වර්ණනාවන්ට අදාලව තේජස මතුකෙරෙන ලෙස සංගීතය යෙදීම.
- දකුණු ඉන්දීය කර්ණාටක සංගීතයේ ආභාසය ලබා තිබීම.
- මුද්‍රප්පදය නම් කොටස, ප්‍රශස්ති ගායනා සඳහාම අවේනික වීම.

❖ **භාවිත කළ සංගීත භාණ්ඩ**

- උඩැක්කි/පංතේරු/ගැටබෙර/තම්මැට්ටම්/දවුල් වැනි දේශීය වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම.

❖ **ඉන්දියානු සංගීතඥයෝ**

- ගණිතාලංකාර සංගීතඥයාගේ සේවාව ලැබීම
- කර්ණාටක සංගීත ශිල්පීන්ගේ/නිර්මාණ හා වාදන විධි ආශ්‍රය වීම

iv. ප්‍රශස්ති හා හටන් ගී අතර ඇති සමානතා හා අසමානතා

➢ **සමානතා**

- ප්‍රශස්ති හා හටන් ගී දෙවර්ගයම මහනුවර යුගයේ දී ප්‍රචලිත වීම.
- සේ ගී ගණයට අයත් වීම.
- ආඝාතාත්මක ගායනා වීම.
- සප්තක තුනම ඇසුරු කිරීම.

➢ **අසමානතා**

- ප්‍රශස්ති ගීත රජ වරුන්ගේ ගුණ වර්ණනා ඇතුළත් ගීත විශේෂයක් වූ අතර, හටන් ගීත හටන් පිළිබඳව ලියැවුණු කාව්‍ය විශේෂයක් වීම.
- ප්‍රශස්ති ගීත වල භාෂාව හා නාද මාලාවන් සංකීර්ණ වන අතර, හටන් ගී වල භාෂාව හා නාද මාලාවන් බොහෝ විට සරල වීම.
- ප්‍රශස්ති ගීත වල මුද්‍රප්පදය නමින් කොටසක් ඇති අතර, හටන් ගීවල එවැනි ගායන විශේෂයක් නොමැතිවීම.
- ප්‍රශස්ති ගීත විවිධ තාල රූප වලට රචනා වී ඇති අතර, හටන් ගී වල කෙටි විරිත් ලක්ෂණ දක්නට ලැබීම.

**5.** පහත සඳහන් වගුවෙහි **A, B, C** සහ **D** මගින් දැක්වෙන්නේ, ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් හතරකට අයත් වන තාල වාද්‍ය භාණ්ඩ හතරකි.

| A | B | C | D |
|---|---|---|---|
|  |  |  |  |
| දොංජි/ජිගත | ධධින/ධතුන | ගුංද/දෙගත | රත් තං කිට/දිත්තං- |

(i) ඉහත වගුවෙහි ඇතුළත් වාද්‍ය භාණ්ඩ ප්‍රධාන වශයෙන් යොදා ගන්නා රංග සම්ප්‍රදායන් හතර හඳුනාගෙන අදාළ අක්ෂර සමග නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) **A** අක්ෂරයට අයත් රංග සම්ප්‍රදායෙහි සුවිශේෂි ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iii) **B** හා **D** අක්ෂරවලට අයත් රංග සම්ප්‍රදායන් දෙකෙහි සංගීතමය ලක්ෂණ **හතරක්** සංසන්දනාත්මකව ලියන්න. (ලකුණු 04 යි.)

(iv) **C** අක්ෂරයට අයත් රංග සම්ප්‍රදාය පිළිබඳ ව පහත කරුණු යටතේ විස්තරයක් ලියන්න.

- සංගීතමය ලක්ෂණ සහ රංග ශෛලිය
- රඟ දක්වන ස්ථාන, චරිත සහ රංග උපකරණ (ලකුණු 08 යි.)

(i) වගුවේ ඇතුළත් වාද්‍ය භාණ්ඩ යොදා ගන්නා, රංග සම්ප්‍රදායන් හතර අක්ෂර සමග නම් කිරීමට **ලකුණු** 04

(ii) ඉංග්‍රීසි A අක්ෂරයට අයත් රංග සම්ප්‍රදායේ සුවිශේෂි ලක්ෂණ හතරක් ලිවීමට **ලකුණු** 04

(iii) ඉංග්‍රීසි B D අක්ෂරයනට අයත් රංග සම්ප්‍රදායන් දෙකෙහි සංගීතමය ලක්ෂණ හතරක් සංසන්දනය කිරීමට **ලකුණු** 04

- C අක්ෂරයට අයත් සංගීතමය ලක්ෂණ සඳහා ල. 02
- C අක්ෂරයට අයත් රංග ශෛලිය සඳහා ල. 02
- රඟ දක්වන ස්ථානය ල.01 /චරිත ල. 01 /රංග උපකරණ 01= ල. 03
- ඉහත කරුණු ගලපා විස්තර කිරීමට ල. 01

**ලකුණු** 08

**මුළු ලකුණු** 20

(i)

A. උඩරට වන්නම්
B. නුර්ති
C. කෝළම්
D. නාඩගම්

(ii) <u>උඩරට වන්නම්</u>

- මහනුවර යුගයේ දී විකාශය සිදුවීම.
- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු සමයේ මෙම වන්නම් නිර්මාණය වීම.
- සේ ගී ගණයට අයත් වීම.
- දක්ෂිණ භාරතීය සංගීතයේ ආභාසය ලබා තිබීම.

- "ගණිතාලංකාර " නම් දක්ෂිණ භාරතීය සංගීතඥයාගේ දායකත්වය ලැබීම.
- මහනුවර "කවිකාර මඩුව " ඇසුරෙහි නිර්මාණය වී තිබීම.
- සප්‍රාණික මෙන්ම අප්‍රාණික වස්තූන් ද වර්ණනා කිරීම.
- " ගැට බෙරය " ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත වීම.
- තානම, කවිය, කස්තිරම, සීරු මාරුව හා අඩව්ව යන කොටස් වලින් යුක්ත වීම.
- නර්තනය සමග බැඳී පැවතීම.
- දේශීය තිත් ක්‍රමය අනුව (විවිධ තිත් රූප මත ) ගොඩ නැගීම.

(iii)

- නූර්ති සංගීතය හින්දුස්ථානි සංගීතයේ (උත්තර භාරතීය ) ආභාසය ලබා ඇති අතර, නාඩගම් කර්ණාටක සංගීතයේ (දක්ෂිණ භාරතීය) ආභාසය ලබා තිබීම.
- නූර්ති සඳහා ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස තබ්ලාවද, ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය ලෙස සර්පිනාවද යොදා ගෙන ඇති අතර, නාඩගම් සඳහා ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස මද්දලය ද, ස්වර වාද්‍ය භාණ්ඩය ලෙස සර්පිනාවද යොදා ගැනීම.
- නාඩගම් හි අඩුතාල් හා වැඩි තාල් වශයෙන් එකවර මද්දල් දෙකක් යොදා ගනු ලබන අතර නූර්ති හා සම්බන්ධයෙන් එසේ සඳහන් නොවේ.
- නූර්ති ගීතයන්හි " දොහොරාව " යනුවෙන් කොටසක් අන්තර්ගත වන අතර, නාඩගම්හි " උරුට්ටුව" යනුවෙන් කොටසක් අන්තර්ගතව තිබීම.
- " දොහොරාව " තාලයකින් තොරව (අපතාලත්මකව) ගැයෙන අතර, උරුට්ටුව තාලාත්මකව ගැයීම.
- නූර්ති ගී තනු සඳහා හින්දුස්ථානි රාග ඇසුරු කරගෙන ඇති අතර, නාඩගම් තනු සඳහා කර්ණාටක රාග ඇසුරු කර තිබීම.
- නූර්ති, හින්දුස්ථානි තාල (දාදරා, කෙහෙර්වා.බෙම්ටෝ) මත නිර්මාණය වී ඇති අතර, නාඩගම් (පසන්, තිර්ලානා, තංගපාඨ) වැනි සුවිශේෂී තාල ක්‍රමයක් ඇසුරු කිරීම.
- නූර්ති සඳහා ස්ථායි, අන්තරා ආකෘතිය ඇති අතර, නාඩගම් සඳහා එවැනි ආකෘතියක් අනුගමනය නොකිරීම.
- නූර්ති ගීත නළු නිළියන් විසින් ම ගයනු ලබන අතර, නාඩගම් සඳහා අත්වැල් ගායක කණ්ඩායමක් යොදා ගැනීම.

(iv)

❖ **කෝළම් රංග සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ**

- පහතරට ශාන්ති කර්ම ආභාසයෙන් නාද රටා නිර්මාණය වී තිබීම.
- නාද රටා සරල බවින් යුක්ත වීම.
- පටු ස්වර ක්ෂේත්‍රයක් ඇසුරු කිරීම.
- ඉහළ ශ්‍රැතියකින් ගැයීම.

- ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස යක් බෙරය යොදා ගැනීම.
- යක් බෙරයේ හඬ ශ්‍රැති ස්වරය ලෙස යොදා ගැනීම.
- ස්වර වාද්‍ය භාණ්ඩය ලෙස හොරණෑව යොදා ගැනීම.
- දෙබස් ගීතවත්ව ඉදිරිපත් කිරීම.
- ගමන් තාල බෙරපද වලට අනුගත ලෙස යොදා ගැනීම.

❖ **කෝළම් රංග සම්ප්‍රදායේ රංග ශෛලිය**

- පහතරට නර්තන අංගයන්ගෙන් පෝෂණය වී තිබීම.
- රංග භූමිය තානායම්පොල නමින් හැඳින්වීම.
- පූර්ව රංගනය, අපර රංගනය වශයෙන් කොටස් දෙකකින් සමන්විත වීම.

❖ **රඟ දක්වන ස්ථාන,චරිත සහ රංග උපකරණ**

- " තානායම්පොල " නමින් හැඳින්වෙන එළිමහන් රංග භූමියක රඟ දැක්වීම.
- දින කිහිපයක් පුරා රඟ දැක්වීම සම්ප්‍රදායක් වීම.
- සබේ විදානේ විසින් චරිත හඳුන්වාදීම.
- හෙන්චප්පු, ජසයා, ලෙංචිනා, නොංචි අක්කා වැනි චරිත වලින් යුක්ත වීම.
- ස්ත්‍රී චරිත ද පිරිමින් විසින්ම රඟ දැක්වීම.
- චරිත සඳහා වෙස් මුහුණු පැළඳීම.
- වෙස් අත්ත, හැරමිටිය, ඔලොගුව, තල් අත්ත, නැම් පනාව

## iii කොටස

6.





(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයේ දැක්වෙන ටයිම් සිග්නේචරයට (Time signature) ගැළපෙන දේශීය තිත නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) දී ඇති ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iii) පෙරදිග ක්‍රමයට ලියූ එම ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් නැවත ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iv) පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරාගෙන නිදසුන් දක්වමින් විස්තර කරන්න.

(a) කවුන්ටර් පොයින්ට් (Counter point) (b) කෝඩ්ස් (Chords)

(c) ඇඩ්ලිබ් (Adlib) (d) හාර්මනි (Harmony) (ලකුණු 03 × 2 = 06 යි.)

i. අපරදිග ස්වර ප්‍රස්තාරයේ ටයිම් සිග්නේචරයට ගැළපෙන දේශීය තිත නම් කිරීමට
**ලකුණු** 02

ii. ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කිරීමට
(එක් විභාගයකට ල.00½ බැගින් හිමිවේ.) **ලකුණු** 06

iii. ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් පෙරළා ප්‍රස්තාර කිරීමට
(එක් විභාගයකට ල.00½ බැගින් හිමිවේ.) **ලකුණු** 06

iv. දී ඇති මාතෘකා වලින් දෙකක් නිදසුන් දක්වමින් විස්තර කිරීමට
(ල.3 x 2) **ලකුණු** 06

i. මැදුම් තනිතිත

ii.

+ පප ස̇ / + පප ධ / මප මධ පම / ධනි ස̇ රි̇ /
ග̇රි̇ ග̇රි̇ ග̇රි̇ / ස̇රි̇ ස̇ - / - නි ධ / ම ධ ප /
ම ග රිග / ස - - / සරි ගම ප / + ගම ප /

iii. මධ්‍යම භාවයට පෙරළා ලිවීම

+ සස ම / + සස රි / නිස නිරි සනි / රිග ම ප /
ධප ධප ධප / මප ම - / - ග රි / නි රි ස /
නි ධ පධ / ම - - / මප ධනි ස / + ධනි ස /

iv.

a) **කවුන්ටර් පොයින්ට් Counter Point**

- යම්කිසි ගීතයක පද වැලෙන් ද්වනිත අර්ථය තීව්‍ර කිරීම සඳහා ගායකයා හෝ ගායිකාව විසින් ගීතය ගයන අතරතුර පසු බිමෙන් ඊට සමගාමීව ප්‍රධාන නාද මාලාවට වඩා හඬ අඩුවෙන් වාදනය වන නාද මාලාව කවුන්ටර් පොයින්ට් නම් වේ.
- උදා:- සඳකඩ පහනක කැටයම් ඔපලා .........ගීතයේ "අහසක් ගුගුරා" කොටසට යොදා ඇත.

B) **ඇඩ්ලිබ් Adlib**

- යම් කිසි සංගීත නිර්මාණයක (ගීතයක/වාදිතයක) නිශ්චිත තාලයකින් තොරව ගැයෙන වැයෙන නාද මාලාව (Adlib) යන නමින් හැඳින්වේ.
- බොහෝ විට සංගීත අධ්‍යක්ෂවරයාගේ/ මෙහෙයවන්නාගේ මග පෙන්වීම අනුව එය ගායනය/ වාදනය වේ.
- උදා:- " සිනිඳු සුදු මුතු තලාවේ..." ගීතයේ ආරම්භයේ දී තාලයෙන් තොරව ගැයෙන කොටස.

C) කෝඩ්ස් **Chords**

- ස්වර දෙකක් ,තුනක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සුසංයෝග වීම කෝඩ් එකක් නමින් හැඳින්වේ.
- ගීතයක හෝ වාදිතයක තනුව, ගැලපෙන පරිදි පසුබිම් ශ්‍රැති ලබා දීම මෙම " කෝඩ්ස්" භාවිතයේ අරමුණ වේ.

උදා:-

C C F G
ග - ම / ප - ග / ම - ග / රි - - /

C C G G
ග - ම / ප - ධ / නි - - / නි - - /

D) හාර්මනි **Harmony**

- ස්වර සංවාදනයයි.
- ප්‍රධාන නාද මාලාවකට අනුගතව සංගතව ඉදිරිපත් කරනු ලබන අනු නාද මාලාවක් හෝ කිහිපයක් එකවර ඉදිරිපත් කිරීමයි.
- මෙය ගායන / වාදන දෙකටම පොදුය.

**7.** (i) පහත දැක්වෙන ගී පාද, ගැළපෙන තාලයකට අනුව පද ප්‍රස්තාර කරන්න.
"සියලු ජාතින් සමග එක් වී - දැයයි සමයයි රකිනු පණ මෙන්" (ලකුණු 04 යි.)

(ii) ඉහත ගී පද ප්‍රස්තාරය සඳහා නිර්දේශිත ඕනෑම රාගයකින් සුදුසු තනුවක් නිර්මාණය කර, ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iii) එම තනුවට ගැළපෙන කෝඩ්ස් (Chords) යොදන්න. (ලකුණු 04 යි.)

(iv) ඔබ නිර්මාණය කළ තනුවට ගැළපෙන පෙරවාදනයක් (Introduction) ප්‍රස්තාර කර, තනුවට ගැළපෙන හින්දුස්ථානි තාලය ද ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

i. ගී පාදය ගැලපෙන තාලයකට අනුව පද ප්‍රස්තාර කිරීමට **ලකුණු** 04

(පද පේලි 4 ක් ලෙස සලකා එක් පේලියකට ල. 01 බැගින්)

ii. නිර්දේශිත රාගයකින් තනුවක් නිර්මාණය කර, ගීත ස්වර ප්‍රස්තාර කිරීමට **ලකුණු** 08

(රාගයට අදාළ වූ ගුණාත්මක බවින් හා නිර්මාණාත්මක බවින් යුත් තනුවක් විය යුතුය)

iii. තනුවට ගැලපෙන කෝඩ්ස් යෙදීමට **ලකුණු** 04

(එක් විභාගයකට ල. 00½ බැගින් හිමිවේ.)

iv.

- තනුවට ගැලපෙන පෙර වාදනයක් නිර්මාණය කිරීමට - ල. 02
- තනුවට ගැලපෙන හින්දුස්ථානී තාලය ප්‍රස්තාර කිරීමට - ල. 02 } **ලකුණු** 04
  - ථේකාවේ නිවැරදි භාවයට ල. 01
  - තාල සංකේත සඳහා ල. 01

**මුළු ලකුණු** 20

i. දෙන ලද ගී පාදය ගැලපෙන තාලයකට අනුව නිවැරදිව පද ප්‍රස්තාර කර තිබිය යුතුය.

ii. පද ප්‍රස්තාරය අනුව සුදුසු තනුවක් නිර්දේශිත රාගයක් ඇසුරින් (**ගුණාත්මක හා නිර්මාණාත්මක බවින් යුතුව**) නිර්මාණය කර ගීත ස්වර නිවැරදිව ප්‍රස්තාර කර තිබිය යුතුය.

iii. එම තනුවට අනුව වඩාත් ගැලපෙන කෝඩ්ස් යොදා තිබිය යුතුය.

iv. නිර්මාණය කළ තනුවට ගැලපෙන පෙර වාදනයක් (Introduction) නිර්මාණය කර ප්‍රස්තාර කර ඊට ගැලපෙන හින්දුස්ථානි තාලය ප්‍රස්තාර කර තිබිය යුතුය.

**8.** (i) පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරාගෙන උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න.

(a) රෝග සුවපත් කිරීමෙහි ලා සංගීතයේ සුවිශේෂී බව

(b) සංගීතමය බුද්ධිය

(c) ශ්‍රී ලංකාවේ චිත්‍රපට ඉතිහාසයේ මුල් යුගයේ දකුණු ඉන්දීය ආභාසය

(d) මිනිස් කටහඬෙහි ගුණාත්මක බව ඇති කිරීමට බලපාන ජීව විද්‍යාත්මක සාධක

(ලකුණු $04 \times 2 = 08$ යි.)

(ii) බ්‍යාල් හෝ ගසල් හෝ **එක්** ගායන ශෛලියක් පිළිබඳ, පහත සඳහන් කරුණු යටතේ විස්තර කරන්න.

- සංගීත භාණ්ඩ
- ගායන ශිල්පීන්
- සංගීතමය ලක්ෂණ
- භාෂා මාධ්‍යය

(ලකුණු 04 යි.)

(iii) රාගාශ්‍රිත සරල ගීයක් පිළිබඳ පහත කරුණු යටතේ ඇගයීමක් කරන්න.

- ආශ්‍රිත රාගයේ නාදමය ලක්ෂණ
- රාගධාරී ශාස්ත්‍රීය අංග
- ගායනයේ සුවිශේෂී බව
- හඬ පාලනය

(ලකුණු 04 යි.)

(iv) (a) සිතාර්, සරෝද්, එස්රාජ් සහ වයලින් යන එක් එක් සංගීත භාණ්ඩ වාදනයට සුප්‍රසිද්ධ ඉන්දියානු ශිල්පියකු බැගින් නම් කරන්න. (ලකුණු 02 යි.)

(b) ඉන් **එක්** සංගීත භාණ්ඩයක් පිළිබඳ සුවිශේෂී කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 02 යි.)

i. මාතෘකා දෙකක් තෝරාගෙන නිදසුන් සහිතව කෙටි විස්තරයක් කිරීමට　**ලකුණු 08**

- **නිදසුන් ලියා තිබේ නම් - ල. 4 x 2 = 08**
- **නිදසුන් ලියා නොමැති නම් - ල. 2x2= 04**

ii. බ්‍යාල් හෝ භජන් ගායනා ශෛලිය දී ඇති කරුණු ඔස්සේ විස්තර කිරීමට　**ලකුණු 04**

(කරුණු හතරට ල. 01 බැගින් හිමි වේ.)

iii. රාගාශ්‍රිත සරල ගීතයක්, දී ඇති කරුණු ඔස්සේ විස්තර කිරීමට　**ලකුණු 04**

(එක් කරුණකට ලකුණු 01 බැගිනි)

iv. (a) එක් එක් සංගීත භාණ්ඩ වාදනයට සුප්‍රසිද්ධ ඉන්දියානු ශිල්පියෙකු බැගින් ශිල්පීන් 4 ක් නම් කිරීමට (ල.00½×4)　**ලකුණු 02**

(b) එක් සංගීත භාණ්ඩයක් පිළිබඳ සුවිශේෂී කරුණු 4 ක් ලිවීමට　**ලකුණු 02**

(කරුණු 4 ට ල. 00½ බැගින් ල. 02 ක් හිමිවේ.)

**මුළු ලකුණු 20**

i.

(a) **රෝග සුවපත් කිරීමෙහිලා සංගීතයේ සුවිශේෂී බව**

- බෝ නොවන රෝග සුවපත් කිරීම සඳහා යොදා ගැනෙන විවිධ චිකිත්සා ක්‍රම අතර සංගීත චිකිත්සාව සුවිශේෂී ස්ථානයක් ගැනීම.
- වෛද්‍ය පර්යේෂකයන්ට අනුව තෝරාගත් සංගීතාංග වලට සවන් දීම තුළින් මිනිසාගේ ස්නායු පද්ධතියට ගුණාත්මක බලපෑමක් සිදු කළ හැකි බව හඳුනා ගෙන ඇති බව.
- සංගීත චිකිත්සාව තුළින් විෂාදය, සාංකාව වැනි මානසික රෝග මෙන්ම අධික රුධිර පීඩනය,දියවැඩියාව වැනි කායික රෝග හා විවිධ ස්නායු ආබාධ අවම කිරීමේ හැකියාවක් පැවතීම.
- රෝග සුව කිරීම සඳහා යොදා ගැනෙන සංගීතය, සඳහා බොහෝ විට මනස සංසුන් කරන මිනිසාගේ සාමාන්‍ය හෘද ස්පන්දන වේගයට වඩා අඩු වේගයකින් (ලයකින්) යෙදෙන සංගීත කෘතීන් යොදා ගැනීම.
- දිනකට සාමාන්‍යයෙන් විනාඩි 20 ක පමණ කාලයක් එවැනි මෘදු සංගීතයක් ශ්‍රවණය කිරීම තුළින් සංගීතයේ පවතින චිකිත්සක ගුණය අපට අත්විඳිය හැකි බව.
- දර්බාරි කාණඩා, භීම්පලාසි, අහීර් භෛරව, මියාංකි මල්ලාර් වැනි විවිධ හින්දුස්තානි රාග සංගීත චිකිත්සාව සඳහා පර්යේෂණ මට්ටමකින් යොදාගෙන ඇති බව.

(b) **සංගීතමය බුද්ධිය**

- පුද්ගලයෙකු සතු විවිධ හැකියා අතරින්, සංගීතමය කුසලතාව ළමාවියේදීම ඉස්මතුවීම.
- පුද්ගලයෙකුගේ සංගීත හැකියා විවිධ මට්ටම් වලින් දැකගත හැකි වීම.
- සංගීතමය හැකියා මුළුමනින්ම පුහුණුවෙන් පමණක්ම ලබා ගත නොහැකි බව.
- සංගීතමය බුද්ධියේ අග්‍ර ඵලය සංගීතඥයා හෙවත් සංගීත ස්වර රචකයා වීම. (නිදසුන්:- බීතෝවන්, මොසාර්ට්, බාක්)
- සංගීතඥයා හෝ සංගීත ස්වර රචකයා විසින් ස්වර, තාල,රිද්ම,නාදරටා හා චලන ඇසුරු කොට නිර්මාණ කාර්යයේ යෙදීම.
- සංගීතඥයා ශබ්ද රටා ඇසුරින් ශ්‍රවණ පරිකල්පනය කිරීම.
- සංගීතඥයා යනු නාද ගබඩාවක් හෝ නාද පුස්තකාලයක් බඳු වීම.

- නිවැරදිව සවන් දීමද, සංගීතමය කුසලතාවයේ අංගයක් වීම.
- භාෂාව ඉගෙනීමේ දී ළමා සංවර්ධන මනෝ විද්‍යාව අදාළ වන්නා සේම, සංගීතය හැදෑරීම සඳහා ද, මනෝ විද්‍යාව අදාල වීම
- සංගීතය පිළිබඳ මනා පරිචයක් ලැබීමෙන් ඒ පිළිබඳ අන්තර් ඥාණයක් ද, පහළ වන බව.

(c) **ශ්‍රී ලංකාවේ චිත්‍රපට ඉතිහාසයේ මුල් යුගයේ දකුණු ඉන්දීය ආභාසය**

- වර්ෂ 1947 ආරම්භ වූ ශ්‍රී ලාංකික චිත්‍රපට කර්මාන්තය දකුණු ඉන්දියාව මුල් කොටගෙන පෝෂණය වීම.
- ඉන්දීය චිත්‍රපට නිෂ්පාදකයින්, සංගීතඥයින්, වාදකයින්, ගායක ගායිකාවන් මෙන්ම ඉන්දීය චිත්‍රාගාර, එරට කාර්මික ශිල්පීන් පසුබිම් කොටගෙන මෙරට චිත්‍රපට නිෂ්පාදනය වීම.
- උදා:- ඉන්දීය නිෂ්පාදකයින්
    - J සිංහ - කඩවුනු පොරොන්දුව
    - K සුබ්‍රමනියම්- කපටි ආරක්ෂකයා
    - T. R. සුන්දරම් - සුජාතා,අහංකාර ස්ත්‍රිය
    - A. S. නායගම් -මාතලන්

- **ඉන්දීය ගායක - ගායිකාවන්**
    - ජමුනා රාණි
    - K. රාණි
    - A. M. රාජා
    - ලතා මංගේෂ්කර්

- **ද්‍රවිඩ චිත්‍රපට වල සෘජු අනුවාද**
    - වේලක්කාරමගල් හා පර ශක්ති - අහංකාර ස්ත්‍රිය
    - මරු මගල් හා ගුමස්තා - පුදුම ලේලි

- **ද්‍රවිඩ සංගීත අධ්‍යක්ෂවරු හා චිත්‍රපට**
    - R. නාරායන් අයියර් - කඩවුණු පොරොන්දුව
    - S. දක්ෂිණ මූර්ති - සුජාතා, සැඩ සුළං
    - T.R. පාපා - සුරඟනී, සුරතලී

- **ද්‍රවිඩ ගීත අනුකරණයෙන් නිර්මාණය කළ සිංහල ගීත**
    - සන්ධ්‍යාවේ ශ්‍රීය රම්‍යා ලෙස පේනා - පර දේශී බාලා

(d) මිනිස් කට හඬෙහි ගුණාත්මක බව ඇති කිරීමට බලපාන ජීව විද්‍යාත්මක සාධක

- මුහුණේ ප්‍රමාණය හා මාංශපේශීවල පිහිටීම. (මුහුණු ප්‍රමාණයෙන් විශාල වූ අයගේ කටහඬ ගැඹුරු බවට ව්‍යවහාරික සංගීතයේ ගායක - ගායිකාවන්ගෙන් නිදසුන්)
- මුඛ කුහරයේ ධාරිතාව, දිව, තොල්පටවල ඝණකම, කටහඬෙහි විවිධතා ඇති කිරීමට බලපාන බව.
- උගුරේ සිහින් බව හෝ මහත් බව (උගුර සිහින් ගායිකාවන්ගේ කටහඬ සිහින් බව සහ උගුර මහත් ගායක ගායිකාවන්ගේ කටහඬ ගැඹුරු බවට ව්‍යවහාරික සංගීතයේ ගායක - ගායිකාවන්ගෙන් නිදසුන්.)
- දත්වල පිහිටීම කටහඬෙහි ගුණාත්මක බවට බලපාන බව. (දත් ඉදිරියට නෙරා ඇති ගායක - ගායිකාවන්ගේ කටහඬෙහි අමුතු මිහිරක් ඇති බවට නිදසුන්)
- කටහඬෙහි විවිධ හඬතල ඇති කිරීමට ගැහැණු, පිරිමි බව හේතුවීම.

ii. **ඛ්‍යාල් ගායන ශෛලිය**

❖ **සංගීත භාණ්ඩ**

- ඍති භාණ්ඩයක් ලෙස තාම්පුරාවත්, තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස තබ්ලාවත්, ස්වර මණ්ඩල වැනි ශ්‍රැති භාණ්ඩ ද, යොදා ගැනීම.
- සහය වාදනයට අළුවෙන් වැයෙන තත් වාද්‍ය භාණ්ඩ මෙන්ම, හාර්මෝනියම් භාණ්ඩයද යොදා ගැනීම.

❖ **ගායන ශිල්පීන්**

- පණ්ඩිත් බිම්සෙන් ජෝෂි, උස්තාද් අමීර් ඛාන්, පණ්ඩිත් ජස්රාජ්, උස්තාද් රෂීඩ් ඛාන්, බෙගම් පර්වීන් සුල්තානා. කිෂෝරි අමෝන් කර්, අශ්විනී බිඩේ දේශ් පාන්ඩේ

❖ **සංගීතමය ලක්ෂණ**

- උත්තර භාරතීය ගායන ශෛලියක් වීම.
- ආරම්භයේ පූර්වාලාප මෙන්ම, රාග මධ්‍යයේ මධ්‍යාලාප දක්නට ලැබීම.
- ස්ථායි හා අන්තරා ආකෘතියෙන් යුක්ත වීම.
- බඩා ඛ්‍යාල් (විලම්භ ලය) හා චොටා ඛ්‍යාල් (මධ්‍ය/ද්‍රෑත ඛ්‍යාල්) යනුවෙන් ගායන/ වාදන ඉදිරිපත් කිරීම.

- බඩා ඛ්‍යාල් ගීත තිලවඩා, ඒක්තාල්, ඣුම්රා යන තාල මත නිර්මාණය වීම හා චොටා ඛ්‍යාල් ගීත ත්‍රිතාල්, රූපක්, ජප් තාල්,දීප්චන්දි යන තාල මත නිර්මාණය වීම.
- අලාප, තානාලංකාර, ඣලා, තිහායි වැනි ගායන/වාදන ශිල්පාංග යොදා ගැනීම.

❖ **භාෂා මාධ්‍යය**

- බොහෝ විට හින්දි භාෂාව ප්‍රමුඛව බ්‍රිජ, පංජාබි වැනි වෙනත් භාෂා ද භාවිතවේ.

## ii. ගසල් ගායන ශෛලිය

❖ **සංගීත භාණ්ඩ**

- මුල් කාලයේ සාම්ප්‍රදායික ගසල් ගායනය සඳහා හාර්මෝනියම් සහ තබ්ලාව ප්‍රධාන කර ගත් අතර, පසු කාලීනව අනිකුත් සංගීත භාණ්ඩ ද, සහාය වාදනය සඳහා යොදා ගැනීම.

❖ **ගායන ශිල්පීන්**

- ගුලාම් අලි, පංකජ් උදාස්, ජග් ජිත් සිං.

❖ **සංගීතමය ලක්ෂණ**

- උත්තර භාරතීය ගායන ශෛලියක් වීම.
- සරල ශාස්ත්‍රීය ගායන විශේෂයක් වීම.
- ආරම්භයේ දී බෝල් ආලාප වැනි තාලයෙන් තොර කෙටි ආලාප කොටස් අන්තර් ගත වීම.
- ස්ථායි හා අන්තරා ආකෘතිය දක්නට ලැබීම.
- දාදරා, කෙහෙර්වා, බෙම්ටෝ වැනි සරල තාල මත රචනා වී තිබීම.
- සරල රාග මෙන්ම, විවිධ රාග මිශ්‍ර කිරීමෙන් ද, නිර්මිත ගසල් ගී දක්නට ලැබීම.
- ඇතැම් විට තබ්ලා වාදකයාගේ දක්ෂතාවය මත " ලග්ගි " සහ අලංකාර පද කොටස් වැයීම.

❖ **භාෂා මාධ්‍ය**

- බොහෝ විට උර්දු, හින්දි, පාර්සි භාෂාවෙන් රචනා වී තිබීම.
- එසේ වුවත්, ප්‍රාදේශීය භාෂා විවිධත්වය අනුව ගීත මාධ්‍ය වෙනස් වීම.

iii. රාගාශ්‍රිත සරල ගීයක් පිළිබඳ පහත කරුණු යටතේ ඇගයීමක් කිරීම.

✓ සිසුවා තෝරා ගත් රාගාශ්‍රිත සරල ගීතය ඇසුරින්, දී ඇති මාතෘකා ඔස්සේ කරුණු ඉදිරිපත් කර තිබේ නම්, එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු ප්‍රදානය කරන්න.

- ආශ්‍රිත රාගයේ නාදමය ලක්‍ෂණ
- රාගධාරී ශාස්ත්‍රීය අංග
- ගායනයේ සුවිශේෂී බව
- හඬපාලනය

iv. a) **ඉන්දීය වාද්‍ය ශිල්පීන්**

- සිතාර් - පණ්ඩිත් රවි ශංකර්, පණ්ඩිත් නිඛිල් බැනර්ජි, උස්තාද් විලායත් ඛාන්, උස්තාද් සහීඩ් පර්වේස්, උස්තාද් අබ්දුල් හලීම් ජෆාර් ඛාන්
- සරෝද් - උස්තාද් අලව්දීන් ඛාන්, උස්තාද් අලි අක්බාර් ඛාන්, උස්තාද් අම්ජාඩ් අලි ඛාන්.
- එස්රාජ් - අශිෂ් චන්ද්‍ර බෙනර්ජි, රන්ධීර් රෝයි, බුද්ධ දේවදාස්.
- වයලින් - පණ්ඩිත් වී. ජී. ජෝග්, ආචාර්ය එන් රාජම්, එල්. සුබ්‍රමනියම්, ඩී. කේ. දාතර්,ෂිෂිර් ඛානාධර් චෞද්රි, ශ්‍රීධර් පර්ශේකර්, ආර්.පී. ශාස්ත්‍රී, ගජනන් රාඕ ජෝශි

b)

**සිතාරය**

- උත්තර භාරතීය සංගීත පද්ධතියට අයත් තත් වාද්‍ය භාණ්ඩයක් වීම.
- ගත් ශෛලියේ වාද්‍ය භාණ්ඩයක් වීම.
- ගත්, විලම්භ ලය (මසීඩ් ඛාණි) සහ මධ්‍යලය (රසාඛාණි) වශයෙන් වාදනය කිරීම.
- තත් හතකින් යුක්ත වන අතර ප්‍රධාන තත නායකී තාර් යනුවෙන් හැඳින්වීම.
- පර්දා සහිත ස්වර පුවරුවකින් යුක්ත වීම.
- අනුනාද තත් ගණනාවක් පිහිටා තිබීම.
- "මිස්රාබ්" නමැති උපකරණයෙන් වැයීම.
- තුම්බා සහිත භාණ්ඩයක් වීම.
- නායකී තත මන්ද්‍ර මධ්‍යමයට සුසර කිරීම.

### සරෝද්

- උත්තර භාරතීය පද්ධතියට අයත් තත් වාද්‍ය භාණ්ඩයක් වීම.
- ගත් ශෛලියේ වාද්‍ය භාණ්ඩයක් වීම.
- ජවා නමැති උපකරණයකින් වාදනය කිරීම.
- සූත් ( මීන්ඩ් ) සහ ඝසීට් වැනි කොටස් වාදනය කළ හැකි වීම.
- පර්දා රහිත භාණ්ඩයක් වීම.
- ගත්, තානාලංකාර හා ඣාලා වැනි කොටස් වැයීම.
- තත් හයකින් යුක්ත වීම හා අනුනාද තත් යොදා තිබීම.
- තුම්බාව සත්ව හමක් යොදා සකස් කර තිබීම හා දාණ්ඩියෙහි පර්දා රහිත රිදී ආලේපිත වානේ ස්වර පුවරුවක් සවි කර තිබීම.

### එස්රාජ්

- උත්තර භාරතීය පද්ධතියට අයත් තත් වාද්‍ය භාණ්ඩයක් වීම.
- තත් හතරකින් යුක්ත වීම හා ප්‍රධාන තත බාජ්කා තාර් යනුවෙන් හැඳින්වීම.
- ගත් ශෛලියේ වාදන සහ ගායකී ශෛලියේ දී ඛ්‍යාල් ගීත, වාදනය සඳහා යොදා ගැනීම.
- අළුවෙන් වැයීම.
- ප්‍රධාන තත් හතරට අමතරව අනුනාද තත් 12 - 15 අතර සංඛ්‍යාවකින් සමන්විත වීම.
- පර්දා සහිත ස්වර පුවරුවකින් යුක්ත වීම.
- ප්‍රධාන තත මන්ද්‍ර මධ්‍යමයට සුසර කිරීම.

### වයලින්

- පෙර අපර දෙදිගටම අයත් තත් වාද්‍ය භාණ්ඩයක් වීම.
- ගායකී සහ ගත් ශෛලියේ වාදන ඉදිරිපත් කිරීමට හැකිවීම.
- තත් ගණන හතරක් වීම.
- අළුවෙන් වැයීම.
- විලම්භ ලය, මධ්‍ය ලය හා ද්‍රැත ලය වාදන ඉදිරිපත් කළ හැකි වීම.
- ඇඟිළි පුවරුවක් සහිත වීම.
- මීන්ඩ්, ගමක්, ඣාලා වැනි සුවිශේෂි අංග ඉදිරිපත් වීම.